
# ගැටලු විසඳන සසුන් පිළිවෙත

20



# සසුන තුළ ඇතිවූ කුමන හෝ ගැටලුකාරී, ව්‍යසනකාරී, ප්‍රශ්නකාරී, අර්බුදකාරී, තත්වයක් විසඳීම සඳහා සංගායනාවන් පවත්වා ඇත.

සංගායනාවක් යනු කුමක් ද ?

ශාසනය තුළ ගැටලුකාරී අවස්ථාවන්හි දී භික්ෂූන් වහන්සේලා එක්ව ධර්මය විනය සජ්ඣායනා කිරීමයි. සාකච්ඡාමය මාර්ගයෙන් සමගිය උදෙසා සාමූහිකව එක්ව කටයුතු කිරීමකි.

# දෙවන ධර්ම සංගායනාව පැවත්වීමට හේතුවූයේ

ප්‍රථම ධර්ම සංගායනාවෙන් ගෙනතිබූ තීරණ තම හිතුමනාපයේ වෙනස් කරමින් වජ්ජිපුත්තක භික්ෂුන්වහන්සේලා දස වස්තුක කාරණා අනුගමනය කිරීමයි.

# දස අකැප වස්තුව

- කප්පති සිංගිලෝණ කප්ප — අඟක ලුණු තබා ගැනිම කැපය
- කප්පති ද්වංගුල කප්ප - හිරු අවරට ගොස් දෑගුලක් වනතුරු ආහාර ගැනීම
- කප්පති ගාමන්තර කප්ප - වළඳා අවසන් කොට නැවත වෙනත් ගමකට ගොස් වැළඳීම කැපය
- කප්පති ආවාස කප්ප - මහා සීමාව තුළ කුඩා ආවාසවල දී පොහොය කිරීම කැපය
- කප්පති අනුමති කප්ප - විනය කර්මවලට නොපැමිණි භික්ෂූන්ගේ කැමැත්ත පසුව ලැබීමේ අදහසින් විනය කර්ම කිරීම
- කප්පති ආචිණ්ණ කප්ප - තම ආචාර්ය පරපුරින් පවත්වා ගෙන පැමිණි කැප අකැප සියල්ල එලෙස පිළිගැනීම සුදුසුය
- කප්පති ආමතික කප්ප - කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි වැලදීම කැපයි
- කප්පති ජලෝගි පාන කප්ප — නොපැසුණු සුරා පානය කැපය
- කප්පති අදසක නිසීදන කප්ප — වාටි නොමැති ඇතිරිලි පරිහරණය කිරීම කැපය
- කප්පති ජාතරූප කප්ප - රන් රිදී කහවනු පිළිගැනීම කැපය

- දායකත්වය
- කාලාශෝක රජතුමා
- බුද්ධ පරිනිර්වානයෙන් වසර 100 යක පසුවයි

මූලිකත්වය

කම්ටුවකි පාර්ශව දෙකින්

- ස්ථානය
- විශාලා මහ නුවර වාලුකාරාමය

සබ්බකාමී
සාල්හ
ඛුජ්ජශෝභිත
වසභගාමී
මහරහතන් වහන්සේලා

සම්භූත
රේවත
යස
සුමන
මහරහතන් වහන්සේලා

- සහභාගී වූ පිරිස මහරහතන් වහන්සේලා 700කි ( සත්ත සතිකා සංගිතිය)

- ගතවූ කාලය
- මාස 08 කි

8. ප්‍රතිඵල

1. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් පිළිගන්නා ලද දස වස්තුව විනය විරෝධී යැයි සංඝ සම්මුතියෙන් ප්‍රතික්ෂේප කිරීම
2. විනය නීති ලිහිල් නොකිරීමට පළමු ධර්ම සංගායනාවේ දී ගන්නා ලද තීරණය ඒ අයුරින් ම ක්‍රියාත්මක කරලීමට එකඟ වීම
3. බුද්ධ කාලයේ පටන් වැඩුණු ශාසනික පැවැත්මට එරෙහි උපද්‍රව ඉවත් කර ශාසනික සම්ප්‍රදායට සංශෝධනයක් ඇති වීම
4. දස වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් වූ අතර උන් වහන්සේලා විසින් මහාසාංඝික නමින් වෙන ම නිකායක් පිහිටුවා ගැනීම හා එතැන් පටන් සංගීතියට මූලික වූ හා එකඟ වූ ශික්ෂාකාමී වූ පැරණි භික්ෂූ සම්ප්‍රදාය ථෙරීය නමින් පෙනී සිටීම.

# තෙවන ධර්ම සංගායනාව

- අශෝක රජු සම්බුදු සසුන වෙනුවෙන් සේවාවන් සිදුකළ හේතුවෙන් ලාභ අපේක්ෂාවෙන් සසුනට ඇතුලු වූ පිරිස් තමතමන් ට අවශ්‍ය පරිදි කටයුතු කළහ.
- මේ හේතුවෙන් භික්ෂුන් එක්ව සිදුකරනු ලබන විනය කර්ම වසර හතක් පුරාම නොපැවතී ගියේ ය.
- සසුනට ආදරය කළ අශෝක රජු මෙය සොයා බලන්නට යැවූ ඇමතිවරයෙකු භික්ෂුන් වහන්සේලා නමක් ඝාතනය කිරීමේ පුවතින්  රජු කම්පාවට පත් ව මේ සඳහා පියවර ගත්තේය

මූලිකත්වය
මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ

අනුග්‍රහය
ධර්මාශෝක රජු

සහභාගී වූ පිරිස
මහරහතන් වහන්සේලා 1000 කි

ස්ථානය
පැළලුප් නුවර අශෝකාරාමයේ මාස 9 ක් පුරා

බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසුවය

# ප්‍රතිඵල

8. ප්‍රතිඵල

1. දුර්මතධාරී භික්ෂූන් වහන්සේලා හැටදහසක් සසුනෙන් නෙරපා හැරීම
2. පොහොය කර්ම ආදිය සාමූහික ව සිදු කිරීමට භික්ෂූන්ට හැකියාව ලැබීම
3. සසුනට ඇතුළු ව තිබූ දුර්මත පන්සීයක් හඳුනාගෙන ඒවාට පිළිතුරු වශයෙන් දක්වන ලද ධර්ම කරුණු පන්සියයක් ඇතුළත් කර කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය රචනා කර අභිධර්ම පිටකයට ඇතුළත් කිරීම. ඒ අනුව ථෙරවාද අභිධර්ම පිටකය ප්‍රකරණ සතක් බවට පත් වීම.
4. බුදු දහම දේශාන්තර වශයෙන් ව්‍යාප්ත කිරීම - ඒ යටතේ රටවල් නවයකට පහත සඳහන් පරිදි ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර හරින ලදි.

| රට | නායකත්වය |
|---|---|
| කාශ්මීර ගන්ධාර | මජ්ඣන්තික හිමි ඇතුළු පිරිස |
| මහිස මණ්ඩලය | මහාදේව හිමි ඇතුළු පිරිස |
| වනවාසී දේශය | රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| අපරන්ත දේශය | යෝනක ධම්ම රක්ඛිත හිමි ඇතළු පිරිස |
| මහා රට්ඨ | මහා ධම්ම රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| යෝනක දේශය | මහා රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| හිමවත් පෙදෙස | මජ්ඣිම හිමි ඇතුළු පිරිස |
| ස්වර්ණ භූමිය | සෝණ උත්තර හිමි ඇතුළු පිරිස |
| තම්බපණ්ණිය | මිහිඳු හිමි ඇතුළු පිරිස |

# පැවරුම

- 01 ධර්ම සංගායනාවක් යනු කුමක්දැයි පහදන්න
- 02 තෙවන ධර්ම සංගායනාවෙන් සසුනට සිදු වූ සේවය විස්තර කරන්න

# 01. පිළිතුරු

- සසුන තුළ ඇතිවූ කුමන හෝ ගැටලු කාරී අර්බුදකාරි තත්වයකට විසදුමක් ලෙස හික්ෂුන් වහන්සේලා එක්ව ධර්මය විනය සජ්ඣායනා කරමින් සසුනේ ඉදිරි පැවැත්ම සදහා පියවර ගැනීමයි. සාකච්ඡා කොට සම්මුතියෙන් එකගතාවයට පැමිණ. ධර්මයේ විනයේ ආරක්ෂාව තහවුරු කිරීමයි.

# 02'

- සංගායනා කිහිපයක් පැවැති අතර එතුළින් තෙවන ධර්ම සංගායනාව විශේෂ වූවකි.
- අශොක රජුගේ පූර්ණ කැපවීම මත නව රට ප්‍රධානව තවත් විශාල ප්‍රදේශයකට ධර්ම ප්‍රචාරය කිරීම
- වෙහෙර විහාර ඉදිවීමත් භික්ෂුන්ට නිසි ගරු සත්කාර ලැබීමත් සිදුවිය.
- අධර්මවාදීන්ගෙන් සම්බුද්ධ ශාශනය ආරක්ෂා වීම
- ත්‍රිපිටකය සම්පූර්ණත්වයට පත්වීම
- ලංකාව වැනි රටවල සම්බුදු දහම අදත් පවතින්නේ තෙවැනි සංගායනාවේ ප්‍රතිඵල සෙලටයි.